අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/59/07/08/01 වෙළු II
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2022.01. 27

..........................................

..........................................

සම්මුඛ පරීක්ෂණ අංකය :- ....................

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරු සඳහා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම.**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ 11.2.2 ට අනුව පවත්වනු ලබන I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරු සඳහා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වා සිටිමි.

02. ඒ සඳහා බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 04 වන මහලේ ශ්‍රවණාගාරයට 2022.02.02 / 09 වන දින පෙ.ව/ ප.ව .................. ට පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. එදිනට පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද අදාළ සහතිකවල ඡායා පිටපත් වෙන වෙනම (අංක I සිට X දක්වා ලේඛන) ගොනු දෙක (02) කින් (මුල් පිටපත් සහ ඡායා පිටපත්) පහත සඳහන් අනුපිළිවෙළට සකස් කර ඔබගේ නම හා සම්මුඛ පරීක්ෂණ අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. සියලුම ලිපි ලේඛන එදිනම ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර පසුව ඉදිරිපත් කෙරෙන සහතිකපත් පිළිබඳව සලකා බැලීමක් සිදු නොකෙරේ.

I. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය
II. උප්පැන්න සහතිකය (නමෙහි වෙනසක් පවතීනම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්)
III. ජාතික හැඳුනුම්පත
IV. සේවා පළපුරුද්ද සනාථ කිරීම සඳහා
   a) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පත්වීම් ලිපිය
   b) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවය ස්ථිර කිරීමේ ලිපිය
   c) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II පන්තියට උසස් කිරීමේ ලිපිය
   d) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I පන්තියට උසස් කිරීමේ ලිපිය
   e) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 1 පන්තියට/ I ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

V. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 03 වන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරිමට අදාළ වන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය.

VI. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට පත් වූ දින සිට 2021.11.05 දින දක්වා සතුටුදායක සේවා කාලයක් පවතින බවටත්, මුළු සේවා කාලය තුළ විනය දඬුවමකට ලක් වී නොමැති බවටත්, වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති බවටත්, වැටුප් රහිත නිවාඩු නොලැබූ බවටත්, නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග සියල්ලෙන්ම සමත් වී ඇති බවටත්, ප්‍රධාන කොමසාරිස්/ පීඨාධිපති/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලබන සහතිකය. (ඇමුණුම 01)

VII. අධ්‍යාපන සුදුසුකම් - අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ලකුණු පරිපාටියේ අනු අංක 02 යටතේ වූ සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික.

VIII. ලකුණු පරිපාටියේ අංක 04 යටතේ තොරතුරු සන්නිවේදන දැනුම පිළිබඳ ලබා ඇති සහතික.

සටහන : සහතික පත්‍රයන්හි පාඨමාලා කාලය සඳහන් නොවේ නම් එම කාලය සනාථ කිරීම සඳහා අදාළ ආයතනයෙන් ලබා ගත් ලිපියක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

IX. ලකුණු පරිපාටියේ අංක 05 යටතේ පහත සුදුසුකම් සනාථ කිරීම සඳහා,

a) ලකුණු පරිපාටියේ අංක 5.l හි සඳහන් පරිදි අධ්‍යාපන ලේකම්/ ප්‍රධාන කොමසාරිස් විසින් නිකුත් කර ඇති හෝ රජයේ පිළිගත් / රජයේ අනුබද්ධිත ආයතනයක් හෝ රජයේ පිළිගත් ජාත්‍යන්තර ආයතනයකින් නිකුත් කරන ලද සහතික

b) අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා සහතික

සටහන : ලකුණු පරිපාටියෙහි 5.l යටතේ සඳහන් කර ඇති පරිදි අදාළ සහතික තහවුරු කළ හැකි ලේඛන ඔබ විසින් ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු, ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) ය.

X. පර්යේෂණ හා ප්‍රකාශන

a) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ලකුණු පරිපාටියේ අංක 06 යටතේ ඔබ විසින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන පර්යේෂණ හා ප්‍රකාශනවල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කිරීමේදී එම පර්යේෂණ/ ප්‍රකාශනය කුමක්ද යන්න පැහැදිලිව දක්වා ඇති පිටුව/ පිටු එම ප්‍රකාශනයන් කෘති/ ප්‍රකාශන ලෙස ඔබගේ නම සඳහන් වන පිටුව/ පිටුවල සහතික කරන ලද පිටපත් සමඟ අදාළ පර්යේෂණ හා ප්‍රකාශනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

04. සන්ධාන භාෂා ප්‍රවීණතාවය,

I. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව ලබා දෙනු ලබන මාතෘකා කිහිපයක් අතුරින් අහඹු ලෙස තෝරා ගනු ලබන මාතෘකාවක් යටතේ මිනිත්තු 03ක කාලයක ඉදිරිපත් කිරීමක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් කළ යුතුය.

II. එම ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වීමට ඔබට මිනිත්තු 20ක කාලයක් ලබා දෙනු ලැබේ.

III. එම ඉදිරිපත් කිරීම පදනම් කරගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

a) විෂයය අන්තර්ගතය - ලකුණු 02

b) ඉදිරිපත් කරන විලාශය - ලකුණු 02

c) භාෂාව හැසිරවීම - ලකුණු 02

05. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන සමස්ථ කුසලතාවය හා පෞරුෂත්වය වෙනුවෙන් උපරිම ලකුණු 05 ක් ප්‍රදානය කරනු ලැබේ.

06. සම්මුඛ පරීක්ෂණයට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිඳු දීමනාවක් ගෙවනු නොලැබේ.

07. මෙම සම්මුඛ පරීකෂණයේදී ඔබ විසින් දක්වනු ලබන කාර්ය සාධනය හා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් අනුව උපයාගනු ලබන ලකුණු මත ලබා ගන්නා සමස්ථ කුසලතාවයේ ප්‍රමුඛතාවය අනුව පමණක් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පීඨාධිපති/ උප පීඨාධිපති/ විදුහල්පති තනතුරු සඳහා පත් කරනු ලැබීම සිදු වේ.

08. මෙම සම්මුඛ පරීක්ෂණයට කැඳවීම හෝ පෙනී සිටීම පමණක් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පීඨාධිපති/ උප පීඨාධිපති/ විදුහල්පති තනතුරක් ලැබීමට හිමිකමක් නොවන බව කාරුණිකව දන්වමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
අතිරේක ලේකම්
(අධ්‍යාපන සේවා ආයතන)

අත්.කලේ / මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**අවධානයට:** මෙම ලිපිය ලද බව සතියේ දිනයන්හි රාජකාරී වේලාව තුළ 0112-787083 යන දුරකථන අංකයට ඇමතුමක් ලබා දී තහවුරු කරන්නේ නම් මැනවි.